නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி செத்சிரிபாய பத்தரமுல்ல
4 th floor, Sethsiripaya ,Battaramulla

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/15/SW/03/01

ඔබේ අංකය / உமது இல / Your No: ............

දිනය / திகதி / Date: 2015-04-06

දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් භාර දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>2015 අතුරු අයවැය යෝජනාව අනුව දිවිනැගුම සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>**

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් මවිසින් ඔබ වෙත යොමු කරන ලද අංක 2015/02 දරණ 2015.03.25 දිනැති දිවිනැගුම සහනාධාර චක්‍රලේඛය හා බැඳේ.

02. දිවිනැගුම ප්‍රතිලාභීන්ට සහනාධාර නිකුත් කිරීම පිළිබඳ ප්‍රගතිය මවිසින් 2015 ජනවාරි සිට මාර්තු දක්වා නියැදියක් ලෙස සමාලෝචනය කරන ලදී. මෙහිදී අනාවරණය වූයේ ඇතැම් දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන්ට ජනවාරි, පෙබරවාරි, මාර්තු යන මාසයන්ට අදාළව එක් මසක හෝ මාස කිහිපයක දීමනා මේ වන තෙක් ගෙවා නොමැති බවය. මේ සඳහා ප්‍රතිපාදන ලැබීම, ගිණුම්ගත කිරීම, ප්‍රතිලාභීන්ට දීමනා ලබා දීම වැනි ක්‍රියාමාර්ගයන්හි යම් යම් අතපසු වීම් හා දුර්වලතා හේතු වී ඇති බව පැහැදිලි විය.

03. කරුණු මෙසේ හෙයින් උක්ත චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කරමින් 2015 අතුරු අයවැය යෝජනාව අනුව දිවිනැගුම සහනාධාර දීමනා ප්‍රතිලාභීන්ට 2015 අප්‍රේල් මාසයේ සිට ගෙවීම් කිරීමට ප්‍රථම, 2015 ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවලට අදාළ සහනාධාර දීමනා, සිංහල,හින්දු අලුත් අවුරුද්දට පෙර ගෙවා නිමකර, ඒ පිළිබඳ වාර්තාවක් මා වෙත පහත සඳහන් විද්‍යුත් තැපැලට යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

විද්‍යුත් තැපැල:- samurdhicom@gmail.com ෆැක්ස් අංකය:-0112873795

04. ඒ අනුව මාගේ අංක DDD/HO/15/SW/03/01 දරණ 2015.03.25 දිනැති ලිපියේ සඳහන් පරිදි 2015.04.09 දිනට යොදා තිබූ, සහනාධාරලාභීන්ට අතුරු අයවැය මගින් වැඩිකරන ලද මුදල් ගෙවීමට අදාළ ජාතික උත්සවය, අප්‍රේල් මස තුන්වන සතියට කල් දමා ඇති බැවින් ඒ සම්බන්ධ උපදෙස් යථාකාලයේදී ඔබ වෙත එවීමට කටයුතු කරනු ඇත.

මෙය ඉතා හදිසි හා වැදගත් කරුණක් සේ සලකා කටයුතු කිරීම අගය කරමි.

එච්.සුමනපාල,

අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

| | |
|---|---|
| 01. පිටපත් ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය | - කරු.දැ.පි. |
| 02. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.පි. |
| 03. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - කරු.දැ.පි. |
| 04. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලන පිළිබඳ අමාත්‍යාංශය | - කරු.දැ.පි. |
| 05. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | - කරු.දැ.පි. |
| 06. අයවැය අධ්‍යක්ෂ ජනරාල් | - කරු.දැ.පි. |
| 07. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කරු.දැ.පි. |
| 08. දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන් | - කරු.දැ.පි. හා අ.කා.ස. |


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2889002 | | 011-2873996 | 011-2887722 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |